(හත්වැනි පාර්ලිමේන්තුව — පළමුවැනි සභාවාරය)

අංක. 6(8).]

# පාර්ලිමේන්තුවේ අංක 6 දරන න්‍යාය පුස්තකය හා සම්බන්ධ පරිපූරකය

**නිකුත් කළේ 2012 සැප්තැම්බර් මස 21 වැනි සිකුරාදා**

## 2012 ඔක්තෝබර් මස 09 වැනි අඟහරුවාදා

## යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*

කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනත යටතේ නියෝගය (අංක 1),— 1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනතේ 14 (1) වැනි වගන්තිය යටතේ සෙස් බදු සම්බන්ධයෙන් මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2012 ජුනි 13 දිනැති අංක 1762/29 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2012.09.18 දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනත යටතේ නියෝගය (අංක 2),— 1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනතේ 14 (1) වැනි වගන්තිය යටතේ සෙස් බදු සම්බන්ධයෙන් මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2012 ජුනි 27 දිනැති අංක 1764/5 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2012.09.18 දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා,— සිවිල් ගුවන් සේවා පනත යටතේ රෙගුලාසි,— 2002 අංක 34 දරන ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය පනතේ 39 (ආ) වැනි වගන්තිය සමග කියවිය යුතු, 2010 අංක 14 දරන සිවිල් ගුවන් සේවා පනතේ 117 වැනි වගන්තිය යටතේ සිවිල් ගුවන් සේවා අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2012 ජනවාරි 25 දිනැති අංක 1742/19 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2012.09.20 දින ඉදිරිපත් කරන ලද රෙගුලාසි අනුමත කළ යුතු ය.

**** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.***

## 2012 ඔක්තෝබර් මස 23 වැනි අඟහරුවාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1883/'11

ගරු බුද්ධික පතිරණ මහතා,— ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) හම්බන්තොට දිස්ත්‍රික්කයේ පිහිටි හුංගම ගජමන්ගම උස්සාන ජල ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු අතරමග නවතා දමා ඇති බවත්;

(ii) එම නිසා එකී ප්‍රදේශයේ ජනතාව දැඩි පීඩාවට පත්ව ඇති බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) එම ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු කඩිනමින් සිදුකිරීමට කටයුතු කරන්නේද;

(ii) ඒ සඳහා ප්‍රතිපාදන වෙන්කර තිබේද;

(iii) එසේ නම්, එම ඉදිකිරීම් කටයුතු ආරම්භ කරන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2147/'11

ගරු දයාසිරි ජයසේකර මහතා,— ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යතුමා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මහව ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ, මහව නගරයේ ජල අවශ්‍යතා සපුරාලීම සඳහා 2005 වර්ෂයේ අග භාගයේදී ඉදිකරන ලද මහව ජල සම්පාදන ක්‍රමය ජනතා අයිතියට පත් කරන ලද දිනය කවරේද;

(ii) එහි ධාරිතාව කොපමණද;

(iii) ඒ යටතේ ප්‍රතිලාභී පවුල් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) එම ජල සම්පාදන ක්‍රමය සඳහා ඇස්තමේන්තුගත මුදල හා වියදම් වූ මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම ඉදිකිරීම් සිදු කරන ලද අය කවුරුන්ද;

(iii) ඒ සඳහා ප්‍රතිපාදන වෙන් කළ අය කවුරුන්ද;

(iv) එහි වර්තමාන තත්ත්වය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2195/'11

ගරු රවි කරුණානායක මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) පසුගිය වර්ෂ පහක කාලය තුළ එක් එක් වර්ෂයේදී, ලංකා පුත්‍ර සංවර්ධන බැංකුවට අදාළව,

(i) යොදවන ලද සමස්ත ප්‍රාග්ධනය සහ සංචිත ප්‍රමාණය කොපමණද;

(ii) කොටස් මත ලද ආදායම් සහ වත්කම් මත ලද ආදායම් ප්‍රමාණයන් කොපමණද;

(iii) කාර්යය මණ්ඩලයෙහි සමස්ත සේවක සංඛ්‍යාව සහ එක් සේවකයෙකු වෙනුවෙන් වැයවන මුළු මුදල් ප්‍රමාණය කොපමණද;

(iv) ඉහත තොරතුරු පෞද්ගලික අංශයේ බැංකු ආයතනයක් හා සන්සන්දනාත්මකව කොපමණද;

(v) පුනරාවර්තන නොවන වියදම් කොපමණද;

(vi) බදු සහ තීරු බදු ලෙස රජයට ගෙවන ලද මුදල් ප්‍රමාණය කොපමණද;

(vii) ලාභය හෝ අලාභය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2225/'12

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) මහින්ද චින්තන ඉදිරි දැක්ම ප්‍රතිපත්ති මාලාවේ "සැමට නිවසක් - හිතට සෙවණක්" වැඩපිළිවෙළ යටතේ, විශ්වවිද්‍යාල ප්‍රජාවේ නිවාස අවශ්‍යතාව සම්පූර්ණ කිරීම සඳහා නිවාස 5000ක් ඒ ඒ විශ්වවිද්‍යාල අවට ඉදිකරදීමට හෝ ඒ සඳහා සුදුසු ඉඩම් කැබැල්ලක් ලබා දීමට අවශ්‍ය ප්‍රතිපාදන වෙන්කරන බවට පොරොන්දුවක් දී ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත වැඩ සටහන සඳහා ප්‍රතිපාදන වෙන්කර තිබේද;

(ii) එසේ නම්, වෙන් කළ මුළු මුදල කොපමණද;

(iii) එම ප්‍රතිපාදන වෙන්කර ඇත්තේ නිවාස ඉදිකිරීමටද, නොඑසේ නම් ඉඩම් කැබලි ලබා දීමටද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2293/'12

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) යුද ජයග්‍රහනයෙන් පසු උතුරු - නැගෙනහිර ප්‍රදේශවල අධ්‍යාපන ක්ෂේත්‍රයේ සංවර්ධනය සඳහා රජය විසින් ගෙන ඇති ක්‍රියාමාර්ගයන් කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) යුද්ධයෙන් පසු උතුරු - නැගෙනහිර ප්‍රදේශවල අධ්‍යාපන සංවර්ධනය සඳහා,

(i) ආධාර ලබාදුන් විදේශීය ආයතන හා රාජ්‍ය නොවන සංවිධාන කවරේද;

(ii) එම එක් එක් ආයතනය මගින් ලබාදී ඇති මූල්‍යමය ආධාරවල වටිනාකම වාර්ෂිකව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) 2009-2012 දක්වා රජය විසින් වාර්ෂිකව කරන ලද මූල්‍ය ප්‍රතිපාදන වෙන්කිරීම අදාළ ව්‍යාපෘති අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2490/'12

ගරු රන්ජන් රාමනායක මහතා,— විදේශ රැකියා ප්‍රවර්ධන හා සුබසාධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) කොස්ගම, වයි. එච්. මිනෝලි මහත්මිය සෞදි අරාබියේ, රියාද් නගරයෙහි, අර්කා පැලස්හි සේවයේ යෙදී සිටියදී මියගොස් ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) මිනෝලි මහත්මියගේ මරණයට හේතුව මේ වනවිට හෙළිවී තිබේද;

(ii) එම හේතුව මරණ පරීක්ෂණ වාර්තාවකින් තහවුරුවී තිබේද;

(iii) ඇයගේ මරණය වෙනුවෙන් මේ වනවිට ඇයගේ ස්වාමිපුරුෂයා ඇතුළු ඥාතීන්ට වන්දි මුදලක් හෝ කිසියම් දීමනාවක් ලබා දීමට කටයුතු කර තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2492/'12

ගරු ගයන්ත කරුණාතිලක මහතා,— පරිසර අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය මගින් ඇල්පිටිය ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශය තුළ වැලි ගොඩ දැමීම සඳහා බලපත්‍ර ලබාදී තිබේද;

(ii) එසේ නම්, ලබා දී ඇති බලපත්‍ර සංඛ්‍යාව කොපමණද;

(iii) එම බලපත්‍රලාභීන්ගේ නම් සහ ලිපිනයන් කවරේද;

(iv) ඔවුන්ට වැලි ගොඩදැමීමට අවසර දී ඇති ස්ථාන කවරේද;

(v) අදාල බලපත්‍රලාභීන් විසින් වැලි ගොඩ දැමීමේදී අනුගමනය කළයුතු කොන්දේසි තිබේද;

(vi) එසේ නම්, ඒවා කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2524/'12

ගරු අනුර දිසානායක මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2011 වර්ෂය තුළදී පළමු වසරට පාසල් සිසුන් ඇතුළත් කරගැනීම, පෙළපොත් බෙදාදීම, නිල ඇඳුම් බෙදාදීම, 5 වසර ශිෂ්‍යත්වය සමත් වූ දරුවන්ට සහතික බෙදාදීම හා සපිරි පාසල් ව්‍යාපෘතිය ආරම්භ කිරීම යන කටයුතුවලට අදාළ එක් එක් ජාතික උත්සවය;

(i) පැවැත්වූ දිනය කවරේද;

(ii) පැවැත්වූ ස්ථානය කවරේද;

(iii) පැවැත්වීමට වැය කළ මුදල කොපමණද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත (අ) හි සඳහන් සියලු ජාතික උත්සව පැවැත්වීමට වැය කළ මුළු මුදල කොපමණද;

(ii) එම මුදල් සපයාගත් ආකාරය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2546/'12

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2009 වර්ෂයේ සිට මේ දක්වා ශ්‍රී ලංකා යුද හමුදාවට, ගුවන් හමුදාවට සහ නාවික හමුදාවට ආහාර සැපයීම සිදු කරනු ලබන පුද්ගලයන් හා ආයතන වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) එම පුද්ගලයන් හා ආයතන තෝරා ගැනීමේදී ටෙන්ඩර් කැඳවීමක් සිදු කළේද;

(iii) එසේ නම්, ඒ සඳහා ටෙන්ඩර් ඉදිරිපත් කරන ලද පුද්ගලයන් හා ආයතන කවරේද;

(iv) එම එක් එක් පුද්ගලයාගේ ආයතනය විසින් ඉදිරිපත් කරන ලද මිල ගණන් කවරේද;

(v) තෝරාගනු ලැබූ පුද්ගලයන් හා ආයතන විසින් ඉදිරිපත් කරන ලද මිල ගණන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2850/'12

ගරු අජිත් පී. පෙරේරා මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) සම්බා සහ නාඩු වී කිලෝවක් සඳහා මේ වන විට ගෙවනු ලබන රජයේ සහතික මිල වෙන් වෙන් වශයන් කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) වර්තමානයේ වී කිලෝවක් නිෂ්පාදනය කිරීම සඳහා වැයවන පිරිවැය කොපමණද;

(ii) එම පිරිවැය ගණනය කරනු ලබන ක්‍රමවේදය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) නිෂ්පාදන වියදමට සාපේක්ෂව වී කිලෝවක් සඳහා ප්‍රමාණවත් සහතික මිලක් ගොවියාට ලබා දෙන්නේද;

(ii) නොඑසේ නම්, වී මිලදී ගන්නා සහතික මිල වැඩි කිරීමට ගන්නා ඉදිරි පියවර කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

2883/'12

ගරු මනූෂ නානායක්කාර මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2012 වර්ෂයේ දී ගාල්ල අධ්‍යාපන කලාපයේ පිහිටි ජාතික පාසල්වල,

(i) පළමුවැනි ශ්‍රේණියේ සිට දහතුන්වැනි ශ්‍රේණිය දක්වා පන්තිවල ඉගෙනුම ලබන සිසුන් සංඛ්‍යාව එක් එක් පන්තිය අනුව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) පළමුවැනි ශ්‍රේණියට සම්මුඛ පරීක්ෂණයෙන් සමත් සිසුන් හැර වෙනත් සිසුන් ඇතුළත් කොට තිබේද;

(iii) පළමුවැනි ශ්‍රේණියට එසේ ඇතුළත් කර ඇති එම සිසුන් කවුරුන්ද;

(iv) පළමුවැනි ශ්‍රේණියට හැර අනෙකුත් ශ්‍රේණි සඳහා සිසුන් ඇතුළත් කර තිබේද;

(v) අනෙකුත් ශ්‍රේණි සඳහා ඇතුළත් කර ඇති එම සිසුන් කවුරුන්ද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත පාසල් සඳහා සම්මුඛ පරීක්ෂණයන්ගෙන් සමත් වන සිසුන් හැර වෙනත් සිසුන් ඇතුළත් කිරීම සඳහා බලය පැවරූ නීත්‍යානුකූල ලිපි ලේඛන තිබේද;

(ii) එකී ලේඛන මෙම සභාවට ඉදිරිපත් කරන්නේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1884/'11

ගරු බුද්ධික පතිරණ මහතා,— දේශීය වෛද්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) මාතර දිස්ත්‍රික්කයේ, මුලටියන ප්‍රාදේශීය සභා කාර්යාල භූමියෙහි පිහිටි ආයුර්වේද බෙහෙත් ශාලාවේ පවතින ඖෂධ හිඟය නිසා ප්‍රදේශයේ ජනතාව දැඩි අපහසුතාවට පත්ව සිටින බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එම බෙහෙත් ශාලාවේ පවත්නා ඖෂධ හිඟය කඩිනමින් මඟහැරවීමට කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, ඊට ගතවන කාලය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2148/'11

ගරු දයාසිරි ජයසේකර මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ජාතික ලොතරැයි මණ්ඩලයට 2005 වර්ෂයේ සිට මේ දක්වා කාලසීමාව තුළ බඳවා ගෙන ඇති සේවක සංඛ්‍යාව වාර්ෂිකව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම ආයතනයේ අනුමත සේවක සංඛ්‍යාව කොපමණද;

(iii) මේ වන විට එහි පවතින සේවක අතිරික්තය හෝ සේවක ඌනතාවය කොපමණද;

(iv) අනුමත සේවක සංඛ්‍යාව ඉක්මවා සේවකයින් බඳවාගෙන තිබේ නම්, එයට හේතු කවරේද;

(v) අතිරික්ත සේවකයින් බඳවා ගැනීමට අනුමතිය ලබා දුන් බලධරයාගේ නම සහ තනතුර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2196/'11

ගරු රවී කරුණානායක මහතා,— ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2011 දී රජය විසින් කොළඹ දිස්ත්‍රික්කය තුළ ඉදිකරන ලද නිවාස සංඛ්‍යාව කොපමණද;

(ii) 2012, 2013 සහ 2014 යන වර්ෂයන්හි දී ඉදිකිරීමට අපේක්ෂිත නිවාස සංඛ්‍යාව කොපමණද;

(iii) ඉහත සඳහන් නිවාස ඉදිකිරීම සඳහා වෙන් කොට ඇති මුදල් ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) අලුතින් ඉදිකරන ලද නිවාස නොමිලේ ලබා දෙන්නේද;

(ii) නොඑසේ නම්, එම නිවාස අලෙවි කරනු ලබන හෝ කුලියට දෙනු ලබන මිල ගණන් කවරේද;

(iii) එම නිවාස ලබා දෙන පදනම කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2226/'12

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) මහින්ද චින්තන ඉදිරි දැක්ම ප්‍රතිපත්ති මාලාවේ "සැමට නිවසක් - හිතට සෙවණක්" වැඩපිළිවෙළ යටතේ, ජල්තර, එඩ්මන්ටන් සහ ටොරින්ටන් නිවාස යෝජනා ක්‍රම වැනි රාජ්‍ය සේවා නිවාස යෝජනා ක්‍රම 25ක් සෑම දිස්ත්‍රික්කයකම ප්‍රධාන නගරය පදනම් කරගෙන, එම දිස්ත්‍රික්කයේ සේවය කරන නිවාස නොමැති රජයේ සහ රාජ්‍ය සංස්ථා සේවකයින් වෙනුවෙන් ආරම්භ කරන බවට පොරොන්දුවක් දී ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත පොරොන්දුව ප්‍රකාරව නිවාස ව්‍යාපෘති ආරම්භකළ වර්ෂය කවරේද;

(ii) මේ වනවිට නිවාස ව්‍යාපෘති ඉදිකර අවසන්කර ඇති නගර සංඛ්‍යාව කොපමණද;

(iii) එම නගර කවරේද;

(iv) ඉදිකිරීම් අවසන් නිවාසවල පදිංචිකර ඇති රජයේ සහ සංස්ථා සේවක පවුල් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2012 ඔක්තෝබර් මස 24 වැනි බදාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1885/'11

ගරු බුද්ධික පතිරණ මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) හම්බන්තොට දිස්ත්‍රික්කයේ, තිස්සමහාරාම දිසා රෝහලේ ඉදිකර ඇති තෙමහල් ගොඩනැගිල්ල භාවිතයට නොගෙන අතහැර දමා ඇති බවත්;

(ii) එම ගොඩනැගිල්ල විවෘත කළ ද ඊට අවශ්‍ය උපකරණ ලබා නොදීම නිසා භාවිතයට නොගෙන අත්හැර දැමීමට සිදුවී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) එසේ නම්, අවශ්‍ය උපකරණ කඩිනමින් ලබා දී ගොඩනැගිල්ල මහජනතාවගේ ප්‍රයෝජනය සඳහා ගැනීමට අවශ්‍ය කටයුතු කරන්නේද;

(ii) අවශ්‍ය උපකරණ ලබා දෙන්නේ නම්, එම දිනය කවරේද;

(iii) ඊට අවශ්‍ය ප්‍රතිපාදන වෙන්කර තිබේද;

(iv) එසේ නම්, එම මුදල කොපමණද;

(v) මහජනතාවගේ ප්‍රයෝජනය සඳහා එම ගොඩනැගිල්ල නැවත විවෘත කරන්නේ කවදාද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2109/'11

ගරු ජෝන් අමරතුංග මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (5)

(අ) (i) සේවක අර්ථසාධක අරමුදල විසින් සීමාසහිත ගලදාරි හෝටල් ලංකා සමාගම, සීමාසහිත ලාෆ්ස් ගෑස් සමාගම සහ සීමාසහිත සිලෝන් ග්‍රේන් එලිවේටර්ස් සමාගම යන සමාගම්වල ලබාගෙන ඇති කොටස් සංඛ්‍යාව කොපමණද;

(ii) එම එක් එක් කොටස් ප්‍රමාණයන් මිලදී ගත් දිනයන් කවරේද;

(iii) ඉහත කී කොටස් ගත් මිල කවරේද;

(iv) එම කොටස් මිලට ගත්තේ කවර පුද්ගලයන්ගෙන්ද;

(v) ඉහත කී කොටස් මිලට ගැනීමෙන් පසු විකුණන ලද්දේ නම්, එම එක් එක් කොටස් ප්‍රමාණය විකුණන ලද්දේ කවර පුද්ගලයින් හටද;

(vi) ඉහත කී එක් එක් කොටස් ප්‍රමාණය විකුණන ලද මිල කවරේද; සහ

(vii) මෙම ගනුදෙනුවලට සම්බන්ධවූ තැරැව්කරුවන්ගේ නම් කවරේද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2149/'11

ගරු දයාසිරි ජයසේකර මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ජාතික ලොතරැයි මණ්ඩලය විසින් පැමිණීමේ හා ප්‍රවාහන දීමනා වශයෙන් වර්ෂ 2005 සිට මේ දක්වා ආයතන සේවකයින් වෙත ගෙවා ඇති මුදල වාර්ෂිකව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම ගෙවීම් සඳහා භාණ්ඩාගාරයේ අනුමතිය ලබා ගෙන තිබේද;

(iii) එසේ නම්, ඊට අදාළ ලේඛන සභාගත කරන්නේද;

(iv) භාණ්ඩාගාරයේ අනුමතිය ලබා ගෙන නොමැති නම්, එයට හේතු කවරේද;

(v) එම ගෙවීම සඳහා අනුමතිය ලබා දුන් පුද්ගලයා හෝ පුද්ගලයින් කවුරුන්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2197/'11

ගරු රවි කරුණානායක මහතා,— ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ප්‍රවාහන අමාත්‍යාංශය තුළ වත්කම් ලේඛනයක් පවත්වාගෙන යන්නේද;

(ii) එසේ නම්, එකී ලේඛනය පවත්වාගෙන යන පුද්ගලයාගේ නම කවරේද;

(iii) අමාත්‍යාංශයෙහි ශුද්ධ වත්කම්වල වටිනාකම කොපමණද;

(iv) අමාත්‍යාංශයේ වැඩිම වැදගත්කම සහිත වත්කම් පහ කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) අමාත්‍යාංශය තුළ කිසියම් ව්‍යාජ වත්කම් පවතින බව වත්කම් පරීක්ෂාකර බැලීම තුළින් අනාවරණය වී තිබේද;

(ii) එසේ නම්, එම වත්කම් හා ඒවායේ වටිනාකම් කවරේද;

(iii) එම වත්කම් පොත්වල සටහන් කර තිබේද;

යන්නද එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2227/'12

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) මහින්ද චින්තන ඉදිරි දැක්ම ප්‍රතිපත්ති මාලාවේ, "සැමට නිවසක් - හිතට සෙවණක්" වැඩපිළිවෙළ යටතේ, උතුරු සහ නැගෙනහිර පළාත්වල අවතැන්වූවන් යළි පදිංචි කරවීම සඳහා නිවාස 15,000ක් ඉදිකිරීමේ වැඩසටහනක් කඩිනමින් ක්‍රියාත්මක කිරීමට මුදල් වෙන්කරන බවට පොරොන්දුවක් දී ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත පොරොන්දුව පරිදි මේ වන විට වෙන්කර ඇති මුදල කොපමණද;

(ii) එම වැඩසටහන යටතේ මේ වනවිට ඉදිකිරීම් අවසන්කර ඇති නිවාස සංඛ්‍යාව කොපමණද;

(iii) එම නිවාසවල පදිංචිකර ඇති පවුල් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2312/'12

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා,— උසස් අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) මේ වන විට ශ්‍රී ලංකාව තුළ රජයේ අනුමතිය ඇතිව ක්‍රියාත්මක වන විදේශීය විශ්වවිද්‍යාලවලට අනුබද්ධව උපාධි සහ පශ්චාත් උපාධි පිරිනමන පෞද්ගලික උසස් අධ්‍යාපන ආයතන සංඛ්‍යාව කොපමණද;

(ii) එම එක් එක් ආයතනයේ නම, ලිපිනය, දුරකථන අංකය සහ ලියාපදිංචි වර්ෂය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම ආයතනවල ප්‍රමිතිය අධීක්ෂණය කරන රජයේ ආයතනය කවරේද;

(iv) අවසන්වරට ප්‍රමිති අධීක්ෂණයක් සිදුකළ ලද වර්ෂය සහ එම ප්‍රමිති අධීක්ෂණයට ලක්වූ උසස් අධ්‍යාපන ආයතන කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) රජයේ අනුමතිය නොමැතිව මේ වනවිට ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක උපාධි සහ පශ්චාත් උපාධි පිරිනමන පෞද්ගලික උසස් අධ්‍යාපන ආයතන සංඛ්‍යාව කොපමණද;

(ii) එම ආයතන ලියාපදිංචිය ලබාගත යුතු ආයතනය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) වර්ෂ 2000 සිට 2010 දක්වා උසස් අධ්‍යාපනය සඳහා විදේශගත වී ඇති ශ්‍රී ලාංකික සිසුන් සංඛ්‍යාව හා විදේශ රටවලින් ශ්‍රී ලංකාවට සංක්‍රමණය වී ඇති සිසුන් සංඛ්‍යාව වාර්ෂිකව, වෙන් වෙන් වශයෙන් කොපමණද යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

2427/'12

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහලේ ප්‍රධාන ආපනශාලාව බඳු දී ඇති ආයතනය කවරේද;

(ii) එම ආයතනයට රෝහල් ආපනශාලාව බඳු දුන් දිනය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) ඉහත ආයතනය යටතේ පාලනය වන රෝහල් ආපනශාලාව මගින් සේවකයන්ට හා රෝගීන්ට සහන ගාස්තු මත ආහාරපාන සපයන බව එතුමා පිළිගන්නෙහිද?

(ඇ) (i) එම ආයතනය මගින් පාන්පිටි නිෂ්පාදනවලට අමතරව වෙනත් ආහාර ලබාදෙන්නේද;

(ii) දියවැඩියා රෝගීන් සඳහා එම ආපනශාලාව මගින් ලබාදෙන පාන්පිටි නොවන ආහාර කවරේද;

(iii) එම ආපනශාලාව මගින් දියවැඩියා රෝගීන් හා අනෙකුත් රෝගීන් සඳහා පාන්පිටි නොවන ආහාර ලබාදීම ප්‍රමාණවත්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

2491/'12

ගරු රන්ජන් රාමනායක මහතා,— විදේශ රැකියා ප්‍රවර්ධන හා සුබසාධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) බහරේන්හි සේවය කළ, අක්මීමන, හියාරේ, නුගේකන්ද ප්‍රදේශයේ පදිංචි මාදුගැට ගමගේ ධර්මවතී නැමැති තිදරු මවට ඇය සේවය කළ අදාළ නිවසේ හිමිකාර කාන්තාව විසින් බලෙන් කම්බි කොකු ගිල්වීම හේතුවෙන් අසාධ්‍යව මේ වන විට ශ්‍රී ලංකාවට ගෙන්වා ඇති බවත්;

(ii) විදේශ රැකියා ප්‍රවර්ධන හා සුබසාධන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක 'සහන් පියස' රක්ෂණ ක්‍රමය යටතේ ඇය හිමිකම් මුදලක් ඉල්ලා ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) සහන් පියස රක්ෂණ ක්‍රමය යටතේ ධර්මවතී මහත්මියට හිමිකම් මුදලක් ලබාදීමට මේ වනවිට ගෙන ඇති පියවර කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2525/'12

ගරු අනුර දිසානායක මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2011 දෙසැම්බර් 31 වනවිට,

(i) පළාත් සභාවන්හි පාලනය යටතේ පැවති පාසල් සංඛ්‍යාව;

(ii) එම පාසල්වල සිටි ශිෂ්‍ය සංඛ්‍යාව හා ගුරුවරුන් සංඛ්‍යාව;

කොපමණද යන්න එක් එක් පළාත් සභාව අනුව, වෙන් වෙන් වශයෙන් එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) එක් එක් පළාත් සභාවේ අධ්‍යාපන අමාත්‍යාංශ මගින් එම පළාත් සභා යටතේ පාලනය වන පාසල් සඳහා 2012 වර්ෂයට අදාළව වෙන්කර ඇති මුදල් ප්‍රමාණයන් කොපමණද යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2851/'12

ගරු අජිත් පී. පෙරේරා මහතා,— සමාජ සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2000 අංක 9 දරන වැඩිහිටි අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනත යටතේ, "වැඩිහිටි හැඳුනුම්පත්" නිකුත් කරනු ලබන්නේද;

(ii) එම හැඳුනුම්පත පිටුපස සෞඛ්‍ය සේවා, බැංකු සේවා, පොලිස් සහ නීති උපදෙස්, තැපැල් හා විශ්‍රාම වැටුප් සහ කාර්යාල කටයුතු යන සේවාවන්වලදී හැඳුනුම්පත්ලාභියාට ප්‍රමුඛතාවයක් ලැබිය යුතු බව සඳහන් වන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) ඉහත කී ප්‍රමුඛතාවය ලබා දීම සඳහා,

(i) රජය විසින් සකස් කොට ඇති නීති හා පනවා ඇති රෙගුලාසි කවරේද;

(ii) එම නීති සහ රෙගුලාසි පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්නේද;

(iii) නොඑසේ නම්, ඊට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) අවම වශයෙන් රජයේ රෝහලක වෛද්‍යවරුන් මුණ ගැසීම, සායනයන්ට සහභාගී වීම සහ බෙහෙත් ලබාගැනීම යන කටයුතුවලදී ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ට ප්‍රමුඛතාව ලබාදීම සඳහා නීතිමය බලය ලැබෙන චක්‍රලේඛයක් සහ / හෝ රෙගුලාසියක් හැකි ඉක්මනින් නිකුත් කිරීමට පියවර ගන්නේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1886/'11

ගරු බුද්ධික පතිරණ මහතා,— පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ගාල්ල දිස්ත්‍රික්කයේ, අම්බලන්ගොඩ තානායමට අයත් ගොඩනැගිලි කඩා දමා යළි ඉදිකිරීමට මුල් ගල් තබා වර්ෂ දෙකකට වැඩි කාලයක් ගත වී ඇතත්, මේ දක්වා එම ඉදිකිරීම් කටයුතු ආරම්භකර නොමැති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එම තානායම නැවත ඉදිකිරීමේ කටයුතු අතරමග නවතා දැමීමට හේතු කවරේද;

(ii) එම ඉදිකිරීම සඳහා ප්‍රතිපාදන වෙන්කර තිබේද;

(iii) එසේ නම්, වෙන් කර ඇති මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) අම්බලන්ගොඩ නගර සභාව සතු මෙම ගොඩනැගිලි කඩා දැමීමට රුහුණු සංචාරක කාර්යාලයට බලය හිමි වූයේ කෙසේද;

(ii) එම ඉදිකිරීම් කටයුතු නැවත ආරම්භ කරන්නේද;

(iii) එසේ නම්, එම දිනය කවදාද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

2150/'11

ගරු දයාසිරි ජයසේකර මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 1992 වර්ෂයේ දී ගුවන් තොටුපල හා ගුවන් සංතරණ අධිකාරියට අරමුදල් රැස් කිරීම පිණිස ආරම්භ කළ ලොතරැයිපතේ වටිනාකම කොපමණද;

(ii) මේ වන විට මුද්‍රණය කර ඇති එම ලොතරැයිපත් සංඛ්‍යාව කොපමණද;

(iii) එම ලොතරැයිපතේ නම කුමක්ද;

(iv) එම ලොතරැයිපතින් ලැබූ ලාභය හෝ අලාභය වාර්ෂිකව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) එම ලොතරැයිය දිනුම් අදින ලද දිනය කවරේද;

(vi) ඒ යටතේ බෙදාදුන් ත්‍යාග කවරේද;

(vii) ඉහත ලොතරැයිපත ආරම්භ කිරීමෙන් අපේක්ෂිත ඉලක්ක මේ වනවිට සපුරාගෙන තිබේද;

(viii) එසේ නම්, ඊට අදාළ තොරතුරු ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2198/'11

ගරු රවී කරුණානායක මහතා,— ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය තුළ වත්කම් ලේඛනයක් පවත්වාගෙන යන්නේද;

(ii) එසේ නම්, එකී ලේඛනය පවත්වාගෙන යන පුද්ගලයාගේ නම කවරේද;

(iii) අමාත්‍යාංශයෙහි ශුද්ධ වත්කම්වල වටිනාකම කොපමණද;

(iv) අමාත්‍යාංශයේ වැඩිම වැදගත්කමක් සහිත වත්කම් පහ කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) අමාත්‍යාංශය තුළ කිසියම් ව්‍යාජ වත්කම් පවතින බව වත්කම් පරීක්ෂාකර බැලීම තුළින් අනාවරණය වී තිබේද;

(ii) එසේ නම්, එම වත්කම් හා ඒවායේ වටිනාකම් කවරේද;

(iii) එම වත්කම් පොත්වල සටහන් කර තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2228/'12

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) මහින්ද චින්තන ඉදිරි දැක්ම ප්‍රතිපත්ති මාලාවේ "සැමට නිවසක් - හිතට සෙවණක්" වැඩපිළිවෙළ යටතේ, නිවාස අහිමි සැමට ඉදිරි වර්ෂ හය තුළ තමන්ගේම නිවසක හිමිකාරීත්වය ලබා දීම සඳහා රජයේ පූර්ණ මැදිහත්වීමෙන් අලුතින් නිවාස ලක්ෂ හයක් ඉදිකිරීම සඳහා සැලසුම් සකස්කරන බවට පොරොන්දුවක් දී ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) මේ වනවිට ඉහත සඳහන් සැලසුම් ක්‍රියාත්මක වන්නේද;

(ii) එසේ නම්, මේ වන විට නිවාස හිමි වූ පවුල් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2526/'12

ගරු අනුර දිසානායක මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2011 දෙසැම්බර් 31 වන විට,

(i) මෙරට පැවති ජාතික පාසල් සංඛ්‍යාව;

(ii) එම පාසල්වල සිටි ශිෂ්‍ය සංඛ්‍යාව හා ගුරුවරුන් සංඛ්‍යාව;

(iii) ජාතික පාසල් සඳහා 2012 වර්ෂය වෙනුවෙන් වෙන්කළ මුළු මුදල;

(iv) මේ වනවිට විදුහල්පති පුරප්පාඩු පවතින ජාතික පාසල් සංඛ්‍යාව;

(v) ජාතික පාසල්වල පළමුවැනි ශ්‍රේණියට ඇතුළුවීම සඳහා 2011 සහ 2012 වර්ෂ තුළදී ඉල්ලුම් කරන ලද ශිෂ්‍ය සංඛ්‍යාව;

(vi) ඉල්ලුම් කරන ලද ශිෂ්‍ය සංඛ්‍යාවෙන් එම පාසල්වලට ඇතුළත් කරගනු ලැබූ ශිෂ්‍ය සංඛ්‍යාව;

කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2012 ඔක්තෝබර් මස 25 වැනි බ්‍රහස්පතින්දා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1887/'11

ගරු බුද්ධික පතිරණ මහතා,— ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) කෑගල්ල දිස්ත්‍රික්කයේ, දෙහිඕවිට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ, අල්ගොඩ, මල්වරුෂා තිඹිරිපොල පිරිවෙන පාරෙහි පිහිටි නිවාස සඳහා සපයනු ලබන ජලය ප්‍රමාණවත් නොවීමෙන් එම ප්‍රදේශයේ ජනතාව දැඩි අපහසුතාවයට පත්ව සිටින බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එම තත්ත්වය සඳහා බලපා ඇති හේතු කවරේද;

(ii) බලපා ඇති එම ගැටලු මඟහරවා කඩිනමින් ජල සැපයුම යථා තත්ත්වයට පත්කිරීමට කටයුතු කරන්නේද;

(iii) එසේ නම්, ඊට ගතවන කාල සීමාව කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2027/'11

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— ළමා සංවර්ධන හා කාන්තා කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) වර්තමානයේ අවිධිමත් හා අනියම් ක්‍රම මගින් කාන්තාවන් හා කුඩා ළමුන් ගෘහ සේවය, ළමුන් රැකබලා ගැනීම හා ගෙවතු නඩත්තුව ආදී රැකියා සඳහා යොදවන බවත්;

(ii) එසේ සේවයේ යෙදෙන කුඩා ළමුන් හා කාන්තාවන් බොහෝවිට නොයෙකුත් වද හිංසාවලට භාජනය වන බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) ඉහත පරිදි ළමුන් සහ කාන්තාවන් වද හිංසාවලට ලක්වීම තුරන් කිරීම සඳහාත්, සේවක හා සේව්‍ය යන දෙපාර්ශ්වයටම යහපතක් වීම සඳහාත්, ඉහත සඳහන් රැකියා අපේක්ෂිත අයට ලියාපදිංචි විය හැකි විධිමත් ක්‍රමවේදයක් සහිත ආයතනයක් පිහිටුවීමට කටයුතු කරන්නේද;

(ii) පිහිටුවන ලද එවැනි ආයතනයක ලියාපදිංචි පුද්ගලයින් පමණක් ඉහත (අ) (i) හි සඳහන් රැකියා සඳහා විධිමත්ව ලබාදීමට අවශ්‍ය පියවර ගන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2151/'11

ගරු දයාසිරි ජයසේකර මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2007 වර්ෂයේදී වීරවිල ගුවන් තොටුපලට අරමුදල් රැස් කිරීම පිණිස ආරම්භ කළ ලොතරැයිපතේ වටිනාකම කොපමණද;

(ii) මේ වන විට මුද්‍රණයකර ඇති එම ලොතරැයිපත් සංඛ්‍යාව කොපමණද;

(iii) එම ලොතරැයිපතේ නම කුමක්ද;

(iv) එම ලොතරැයිපතින් ලැබූ ලාභය හෝ අලාභය වාර්ෂිකව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) එම ලොතරැයිය දිනුම් අදින ලද දිනය කවරේද;

(vi) ඒ යටතේ බෙදාදුන් ත්‍යාග කවරේද;

(vii) එම ලොතරැයිය පවත්වාගෙන යාම සඳහා ගුවන් තොටුපල හා ගුවන්සේවා සමාගම වෙත ලොතරැයි මණ්ඩලය විසින් ගෙවන ලද බදු හෝ කුලී ප්‍රමාණය වාර්ෂිකව, වෙන් වෙන් වශයෙන් කවරේද;

(viii) මෙම ටිකට්පත ආරම්භ කිරීමෙන් අපේක්ෂිත ඉලක්ක මේ වනවිට සපුරාගෙන තිබේද;

(ix) එසේ නම්, ඒ පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2199/'11

ගරු රවී කරුණානායක මහතා,— පශු සම්පත් හා ග්‍රාමීය ප්‍රජා සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) පසුගිය වර්ෂ හතරක කාලය තුළ, එක් එක් වසරේදී සී/ස මිල්කෝ පුද්ගලික සමාගම,

(i) ලැබූ ලාභය හෝ අලාභය කොපමණද;

(ii) සේවයේ යොදවා ඇති කාර්ය මණ්ඩල සාමාජිකයින් සංඛ්‍යාව; එක් සේවකයකුගෙන් ලැබූ ලාභය සහ එක් සේවකයකු සඳහා දරන ලද පිරිවැය කොපමණද;

(iii) රජයට ගෙවූ තීරුබදු සහ බදු ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) සී/ස මිල්කෝ සමාගම තුළ මේ දක්වා යොදවන ලද ගෙවා හිමි ප්‍රාග්ධන සහ සංචිත කවරේද;

(ii) එම ආයතනයට ලබා දෙන පොහොර සහනාධාරය සඳහා කරන ලද වියදම් රජය විසින් ප්‍රතිපූරණය කර ගන්නා ආකාරය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2527/'12

ගරු අනුර දිසානායක මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සපිරි පාසල් ව්‍යාපෘතිය සඳහා 2012 ජනවාරි 31 වනවිට තෝරා ගෙන තිබූ පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට 2012 වර්ෂයේදී වැයකිරීමට අපේක්ෂිත මුදල කොපමණද;

(iii) දැනට එම මුදල් ප්‍රතිපාදන ලැබී ඇති ආකාරය කවරේද;

(iv) 2012 වර්ෂයේ පළමු කාර්තුව තුළ සපිරි පාසල් ලෙස තෝරාගත් එක් එක් පාසල සඳහා ලබාදුන් මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2548/'12

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2009 වර්ෂයේ සිට මේ දක්වා ශ්‍රී ලංකා පොලීසිය වෙත ලැබී ඇති ස්ත්‍රීදූෂණ, ලිංගික අපයෝජන හා ළමා අපචාර පැමිණිලි සංඛ්‍යාව දිස්ත්‍රික් මට්ටමින්, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම පැමිණිලි අතරින් මේ වනවිට පරීක්ෂණ අවසන් කර ඇති පැමිණිලි සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම් ඒ මන්ද?

2781/'12

ගරු අජිත් පී. පෙරේරා මහතා,— ජනමාධ්‍ය හා ප්‍රවෘත්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2012.05.01 දින යාපනයේ පැවති ඒකාබද්ධ විපක්ෂයේ මැයි රැළියේදී කොටි සංවිධානයට අයත් කොඩියක් යම් අයෙකු විසින් ප්‍රදර්ශනය කරන රූපරාමු ඇතුළත් ප්‍රවෘත්තියක් ස්වාධීන රූපවාහිනී සේවය ඔස්සේ විකාශය කළේද;

(ii) ස්වාධීන රූපවාහිනී සේවයට අයත් මාධ්‍යකරුවෙක් හෝ කණ්ඩායමක් විසින් එකී මැයි රැළිය රූගත කරනු ලැබුවේද;

(iii) නොඑසේ නම්, කොටි සංවිධානයට අයත් කොඩියක් ප්‍රදර්ශනය කිරීමේ දර්ශන ඇතුළත් වීඩියෝ පටය ස්වාධීන රූපවාහිනී සේවයට ලබා දුන් පුද්ගලයා කවුරුන්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) ස්වාධීන රූපවාහිනී සේවය විසින්,

(i) ඉහත වීඩියෝ පටයේ අව්‍යාජභාවය හෝ නිරවද්‍යභාවය තහවුරු කරගනු ලැබූ ආකාරය කවරේද;

(ii) ඉහත කී දර්ශන ඇතුළත් රූපරාමු විකාශය කරන ලද වාර ගණන කොපමණද;

(iii) එම දර්ශන විකාශය කරන ලද දින හා වේලාවන් කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1888/’11

ගරු බුද්ධික පතිරණ මහතා,— ජාතික උරුමයන් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මාතර දිස්ත්‍රික්කයේ, දික්වැල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටි දික්වැල්ල කුමාරතුංග ජන කෞතුකාගාරය වෙනුවෙන් ඉදිකළ ගොඩනැගිල්ල මේ වනවිට විනාශ වෙමින් පවතින බවත්;

(ii) එම ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු නිසි ප්‍රමිතියකින් සිදුකර නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) එම ගොඩනැගිල්ල ප්‍රතිසංස්කරණය කිරීමට කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, එම කටයුතු ආරම්භ කරන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2152/’11

ගරු දයාසිරි ජයසේකර මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2011 නොවැම්බර් මස 25 වැනි දින පැවති ශ්‍රීපාදස්ථානාධිපති ස්වාමීන්වහන්සේ තේරීමේ ඡන්ද විමසුම සඳහා ඉදිරිපත් වූ භික්ෂූන්වහන්සේලාගේ නම් කවරේද;

(ii) එහිදී ඡන්දය ප්‍රකාශ කිරීමට අයිතිය තිබූ භික්ෂූන්වහන්සේලා සංඛ්‍යාව කොපමණද;

(iii) ඡන්දය ප්‍රකාශ කිරීම සඳහා ගිහියන්ට අවස්ථාව ලබා දී තිබේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඡන්දහිමි භික්ෂූන්වහන්සේලා පැහැර ගැනීමක් හෝ ඡන්දපොලට පැමිණෙන භික්ෂූන්වහන්සේලාට බාධා කිරීමක් හෝ සිදු කර තිබේද;

(ii) එසේ නම්, ඊට මැදිහත්වූ පිරිස හඳුනාගෙන තිබේද;

(iii) ඔවුන් සම්බන්ධයෙන් ගන්නා ක්‍රියාමාර්ග කවරේද;

(iv) එම ඡන්ද විමසීමට අදාළව රජයේ අමාත්‍යවරුන්ට සහ මහජන නියෝජිතයින්ට යම් කාර්ය භාරයක් පවරා තිබුණේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ආනන්තරීය පාපකර්මයක් වන සංඝ භේදයට හේතුවන සිදුවීම් එකී කාල සීමාවේ දී සිදු වූ බව පිළිගන්නේද;

(ii) එසේ නම්, ඒ සම්බන්ධයෙන් ගන්නා ක්‍රියාමාර්ග කවරේද;

(iii) ඉදිරියේදී එවැන්නක් සිදු නොවීමට ගන්නා ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2200/'11

ගරු රවී කරුණානායක මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය තුළ වත්කම් ලේඛනයක් පවත්වාගෙන යන්නේද;

(ii) එසේ නම්, එකී ලේඛනය පවත්වාගෙන යන පුද්ගලයාගේ නම කවරේද;

(iii) අමාත්‍යාංශයෙහි ශුද්ධ වත්කම්වල වටිනාකම කොපමණද;

(iv) අමාත්‍යාංශයේ වැඩිම වැදගත්කමක් සහිත වත්කම් පහ කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) අමාත්‍යාංශය තුළ කිසියම් ව්‍යාජ වත්කම් පවතින බව වත්කම් පරීක්ෂාකර බැලීම තුළින් අනාවරණය වී තිබේද;

(ii) එසේ නම්, එම වත්කම් හා ඒවායේ වටිනාකම් කවරේද;

(iii) එම වත්කම් පොත්වල සටහන් කර තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2230/'12

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2005 - 2010 අතර කාල වකවානුව තුළ රට තුළ වසා දැමූ රජයේ පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) පාසල් වසාදැමීමට ප්‍රධානතම හේතුව ප්‍රමාණවත් සම්පත් නොලැබීම බව පිළිගන්නේද;

(iii) නොඑසේ නම්, එම පාසල් වසා දැමීමට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2529/'12

ගරු අනුර දිසානායක මහතා,— උසස් අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) විශ්වවිද්‍යාල සිසුන් සඳහා ලැප්ටොප් පරිගණක ලබාදීමේ ව්‍යාපෘතියක් උසස් අධ්‍යාපන අමාත්‍යාංශය මඟින් ක්‍රියාත්මක කරන්නේද;

(ii) එම පරිගණක ලබාදීම සඳහා සිසුන් තෝරා ගැනීමේ නිර්ණායක කවරේද;

(iii) මේ වනවිට ලැප්ටොප් පරිගණක ලබාදී ඇති සිසුන් සංඛ්‍යාව කොපමණද;

(iv) අනෙකුත් විශ්වවිද්‍යාල සිසුන්ට ලැප්ටොප් පරිගණක ලබාදීමට කොපමණ කාලයක් ගතවේද;

(v) ඒ සඳහා වැයවෙතැයි අපේක්ෂිත මුළු මුදල කොපමණද;

(vi) එම මුදල් සොයා ගැනීම සඳහා සකස් කරන වැඩපිළිවෙළ කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2554/'12

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2009 මැයි 30 වැනි දිනෙන් පසුව ශ්‍රී ලංකා ගුවන් හමුදාවට ගුවන් යානා මිලදී ගෙන තිබේද;

(ii) එසේ නම්, මිලදී ගෙන ඇති ගුවන් යානා සංඛ්‍යාව එක් එක් වර්ගය අනුව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ඉහත මිලදී ගැනීම්වලදී ටෙන්ඩර් පටිපාටියක් අනුගමනය කර තිබේද;

(iv) එසේ නම්, ඒ සඳහා ටෙන්ඩර් ඉදිරිපත් කරන ලද සමාගම් කවරේද;

(v) එම එක් එක් සමාගම් විසින් ඉදිරිපත් කරන ලද මිල ගණන් කවරේද;

(vi) ගුවන් යානා මිලදී ගැනීම සඳහා අදාළ ආයතන තෝරාගත් පදනම කවරේද;

(vii) එම ගුවන් යානා මිලදී ගැනීමට වැය කරන ලද මුළු මුදල කොපමණද;

(viii) එවැනි ගුවන් යානා සංඛ්‍යාවක් මිලදී ගැනීමට හේතුව කවරේද;

යන්න එතුමා මේ සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2853/'12

ගරු අජිත් පී. පෙරේරා මහතා,— පරිසර අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ඉන්දියාවේ තමිල්නාඩු ප්‍රාන්තයේ, කන්‍යාකුමාරි දිස්ත්‍රික්කයේ, කුඩන්කුලම් න්‍යෂ්ටික විදුලි බලාගාරය (Kudankulam Nuclear Power Plant) නම් ව්‍යාපෘතියක් ක්‍රියාත්මක වන බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එම න්‍යෂ්ටික විදුලි බලාගාරයේ ධාරිතාවය කොපමණද;

(ii) එහි සිට ශ්‍රී ලංකාවේ මුහුදු සීමාවට ඇති දුර ප්‍රමාණය කොපමණද;

(iii) එය පිහිටි ස්ථානයේ සිට ශ්‍රී ලංකාවට ඇති දුර ප්‍රමාණය කොපමණද;

(iv) එහි ස්ථාන තක්සේරු වාර්තාව (Site Evaluation Study Report) ශ්‍රී ලංකා රජයට ලැබී තිබේද;

(v) එහි ආරක්ෂක විශ්ලේෂණ වාර්තාව (Safety Analysis Report) ශ්‍රී ලංකා රජයට ලැබී තිබේද;

(vi) ඉහත වාර්තා සභාගත කරන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) ඉහත සඳහන් විදුලි බලාගාරය හේතුවෙන් ශ්‍රී ලංකාවේ පරිසරයට සිදුවිය හැකි බලපෑම පිළිබඳ ශ්‍රී ලංකා රජය මේ වන විට සිදුකර ඇති අධ්‍යයනයන් කවරේද;

(ii) එම අධ්‍යයනයන්හි වාර්තා සභාගත කරන්නේද;

(iii) ඉහත කී න්‍යෂ්ටික විදුලි බලාගාරය හේතුවෙන් ශ්‍රී ලංකාවේ පරිසරයට සිදුවන හානි වැළැක්වීම සඳහා ශ්‍රී ලංකාවේ රජය විසින් ගෙන ඇති පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

2232/'12

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— ගොවිජන සේවා හා වනජීවී අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2011 අංක 46 දරන ගොවිජන සංවර්ධන (සංශෝධන) පනත තුළින් අද ගොවියාගේ අද අයිතිය ආරක්ෂා වීම අපේක්ෂා කළමුත් මේ වනවිටත් අද අයිතිය අහිමි කරන ක්‍රියාමාර්ග රැසක් ක්‍රියාත්මක වන බව එතුමා පිළිගන්නෙහිද?

(ආ) එසේ නම්, මෙම අඩුපාඩුව මඟහරවා ගැනීමට ගන්නා වූ ක්‍රියාමාර්ග කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?